# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන)

**1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කම්කරු අමාත්‍යතුමා විසින් 2020 ඔක්තෝබර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2020 ඔක්තෝබර් මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[9 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

*2 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ වයස අවුරුදු දහසය සහ දහඅට අතර සිටින තරුණ අය, "තරුණ අය" පිළිබඳ අර්ථ නිරූපණය ප්‍රකාරව "තරුණ අය" වශයෙන් හැඳින්වීම වේ.

*3 වන වගන්තිය* : මේ වගන්තිය 2 වන වගන්තියේ සඳහන් සංශෝධනයට ආනුෂංගික වේ.

*4 වන වගන්තිය* : (1) මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ—

(අ) යාත්‍රාවක සේවා නියුක්තවීමේ අවම වයස අවුරුදු පහළොවේ සිට දහසය දක්වා වැඩි කිරීම සහ

(ආ) පාඨමාලා-නැව් (School Ships) සහ පුහුණුවීමේ නැව්වල සේවා නියුක්තවීමේ අවම වයස අවුරුදු පහළොවේ සිට දහසය දක්වා වැඩි කිරීම වේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත්කරනු ලබන අතර, එය (1) වන උපවගන්තියට සහ (2) වන උපවගන්තියට කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

*5 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පරිච්ඡින්න කරනු ලබන අතර එය 4 වන වගන්තියේ සඳහන් සංශෝධනයට ආනුෂංගික වේ.

*6 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ—

(අ) (1) වන උපවගන්තියේ සඳහන් ළමයා සහ තරුණ අය පිළිබඳව "ළමයා" යන යෙදුම සඳහා වූ අර්ථ නිරූපණය ප්‍රකාරව සඳහන් කිරීම;

(ආ) (2) වන උපවගන්තියේ සඳහන් වයස අවුරුදු දාහතරට එළඹ ඇති එහෙත් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන් පිළිබඳව "තරුණ අය" යන යෙදුම සඳහා වූ අර්ථ නිරූපණය ප්‍රකාරව සඳහන් කිරීම; සහ

(ඇ) (4) වන උපවගන්තියේ සඳහන් වයස අවුරුදු දහසයට එළඹ ඇති එහෙත් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන් පිළිබඳව "තරුණ අය" යන යෙදුම සඳහා වූ අර්ථ නිරූපණය ප්‍රකාරව සඳහන් කිරීම,

වේ.

*7 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ—

(අ) "ළමයා", "රාත්‍රිය" සහ "තරුණ අය" යන වචන සඳහා වූ අර්ථ නිරූපණ සංශෝධනය කිරීම; සහ

(ආ) ප්‍රාථමික පාසල් යන තැනැත්තකුගේ වයස අවුරුදු දහසය දක්වා වැඩි කිරීම වේ.

# ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන)

එල්.ඩී.—ඕ. 33/2018

## 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2020 අංක       දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1956 අංක 47 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (3) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසයට එළඹ ඇති නමුත් වයස අවුරුදු දහඅටට අඩු පිරිමි තරුණ අය" යන වචන වෙනුවට "පිරිමි තරුණ අය" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (4) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසය සහ වයස අවුරුදු දහඅට අතර අය" යන වචන වෙනුවට "තරුණ අය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (5) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසය සහ වයස අවුරුදු දහඅට අතර අය" යන වචන වෙනුවට "තරුණ අය" යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසයට එළඹ ඇති නමුත් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු" යන වචන වෙනුවට "තරුණ අයකු" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) (අ) ඡේදයේ "අවුරුදු පහළොව" යන වචන වෙනුවට "අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) (ආ) ඡේදයේ "අවුරුදු පහළොව" යන වචන වෙනුවට "අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "අවුරුදු පහළොව" යන වචන වෙනුවට "අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (3) වන උපවගන්තිය මෙයින් ඉවත් කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය ඉවත් කිරීම.*

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසයට එළඹ නොමැති කිසිදු ළමයකු හෝ තරුණ අයකු" යන වචන වෙනුවට "කිසිදු ළමයකු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "වයස අවුරුදු දහහතරට එළඹ ඇති නමුත් වයස අවුරුදු දහඅටට අඩු කිසිම තැනැත්තකු" යන වචන වෙනුවට "කිසිදු තරුණ අයකු" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (4) වන උපවගන්තියේ “වයස අවුරුදු දහසයට එළඹ ඇති නමුත් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු” යන වචන වෙනුවට “තරුණ අයකු” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) “ළමයා” යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

“ළමයා” යන්නෙන්, වයස අවුරුදු දහසයට අඩු තැනැත්තකු අදහස් වේ;”;

(ආ) (ඇ) ඡේදයේ “කාර්මික ව්‍යවසාය” යන යෙදුමේ අර්ථකථනයේ “අවුරුදු දහහතර” යන වචන වෙනුවට “අවුරුදු දහසය” යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) “රාත්‍රී කාලය” යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

“රාත්‍රී කාලය” -

(අ) ස්ත්‍රීන් සේවයෙහි යෙදවීම සම්බන්ධයෙන්, ප. ව. 10 සිට පෙ. ව. 5 දක්වා වූ කාලය ඇතුළුව යටත් පිරිසෙයින් අනුගාමී පැය එකොළහක කාලය අදහස් වේ; සහ

(ආ) වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන් සේවයෙහි යෙදවීම සම්බන්ධයෙන්, පෙ. ව. 6 ට පෙර අවසන් විය යුතු යටත් පිරිසෙයින් අනුගාමී පැය දොළහක කාලය අදහස් වන අතර,

(i) (ii) වන අනුඡේදයේ විධිවිධානවලට යටත්ව, වයස අවුරුදු දහසයකට එළඹ ඇති එවැනි තැනැත්තන් සම්බන්ධයෙන් වන විට, ප. ව. 10 සහ පෙ. ව. 6 දක්වා වූ කාලය අතරට වැටෙන යටත් පිරිසෙයින් අනුගාමී පැය හතක කාලයක් ඇතුළත් වේ; සහ

(ii) වයස අවුරුදු දහසයකට එළඹ ඇති එවැනි තැනැත්තන් සහ බේකින් කර්මාන්තයේ වෘත්තීය පුහුණුවක නියැලෙන හෝ එම කර්මාන්තයේ ආධුනිකයන් වන තැනැත්තන් සම්බන්ධයෙන් වන විට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එසේ විධාන කරනු ලබන්නේ නම්, (i) වන අනුඡේදයේ සඳහන් යටත් පිරිසෙයින් අනුගාමී පැය හතක කාලය වෙනුවට සියලු සේවකයන් සඳහා රාත්‍රී කාලයේ දී එම කර්මාන්තයේ වැඩ කිරීම තහනම් කරනු ලබන්නේ නම්, ඊට ප. ව. 9 සහ පෙ. ව. 4 දක්වා වූ කාලය අතරට වැටෙන අනුගාමී පැය හතක කාලය ඇතුළත් වේ;";

(ඈ) "තරුණ අය" යන යෙදුමේ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

"තරුණ අය" යන්නෙන්, වයස අවුරුදු දහසය සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ."; සහ

(2) එහි (2) වන උපවගන්තියේ (අ) අනුඡේදයේ "අවුරුදු දාහතර" යන වචන වෙනුවට "අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.